# භරත නාට්‍යම්

## විෂය නිර්දේශය

## 8 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

# හැඳින්වීම

ප්‍රාථමික අධ්‍යාපනය හමාර කර, කනිෂ්ඨ ද්විතීයක අංශයේ 10 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලැබීමට පැමිණෙන දරුවන්ට සුදුසු පරිදි භරත නාට්‍යම් නව විෂය නිර්දේශය සැලසුම් කර ඇත. නව අධ්‍යාපන අරමුණු හා සංකල්ප මෙහි අන්තර්ගතය.

මීට පෙර භරත නාට්‍යම්, කර්ණාටක සංගීතය, නාට්‍ය හා රංග කලාව ආදි, කලා විෂයන් සියල්ල එකට ඉගැන්වූ අතර, 2007 වර්ෂයේ සිට 6වන ශ්‍රේණිය සඳහා මේ විෂයන් වෙන වෙනම රස වින්දනය, නිර්මාණ කුසලතා, ක්‍රියාකාරකම්, දැනුම, සංස්කෘතික පසුබිම ආදී ලක්ෂණ පසුබිම් කරගත් ඉගෙනුම් නිපුණතා යටතේ මෙම විෂය නිර්දේශය සංශෝධනය කරන ලදි.

ලෝකය නොයෙකුත් වෙනස්වීම්වලට භාජනය වේ. ඊට අනුව කලා විෂය නිර්දේශවල ද වෙනස්කම් ඇතිවීම වැළැක්විය නොහැකි ය. ඕනෑ ම කලා විෂය නිර්දේශයක් අංශ 2ක් යටතේ වෙනස්කමකට භාජනය වේ.

1. විෂය කොටස් එකතු වීම - විෂය කොටස්වල වෙනස්කම් සිදු කිරීම, විෂය කරුණු පහසුවෙන් අවබෝධ කර ගැනීම.
2. විෂය කරුණු සිසුන් වෙත ළඟා කරවීම සඳහා ඉදිරිපත් කරන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දෙන මෙම නව විෂය නිර්දේශය ශිෂ්‍යයන් හා ගුරුවරුන් එකතු ව ක්‍රියාත්මක කළ යුතු බව තහවුරු කරයි. සිසුන් විෂය කරුණු සොයා ගනිමින් ඉගෙනීමට පෙලඹවීමේ ක්‍රියාකාරකම් බොහෝ ගණනකින් මෙය සමන්විත ය. සිසුන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම පැහැදිලි ව අවබෝධ කරගෙන තමා ම, කැමැත්තෙන් මෙම කටයුතුවල නියැලීමට සුදුසු පරිදි මෙම විෂය නිර්දේශය සකස් කර ඇත.

පවතින අධ්‍යාපන ක්‍රමයේ වැදගත් අවස්ථා තුනක්

1. ලබාගත් දැනුම රැකගැනීම.
2. කලින් සැලසුම් කළ විෂය කරුණු ඉගෙනීම.
3. කලින් ඉගෙනගත් විෂය කරුණු නැවත ගොඩනගා ගැනීම.

මෙහි ඇති ක්‍රියාකාරකම් සිසුන් ඉගෙනගත් දේ වෙනසකට භාජනය කර, නව මුහුණුවරකින් නව සමාජයක් ගොඩනැඟීමට උත්සාහ දරයි. මේ සඳහා තරුණ සමාජය දැනුම්වත් කිරීම අවශ්‍ය යි. සොයාගැනීම්වල නියැලි, කලින් දැන සිටි දේ වෙනස් කර, මේ තාක් නොදැන සිටි දේ සොයා ඉගෙනීමට හුරු කිරීම මෙම විෂය නිර්දේශයේ අරමුණ යි.

පහසුවෙන් ජීවිකාව කරගෙන යාමට අවශ්‍ය කුසලතාවලින් හා දක්ෂතාවලින් පිරිපුන් යහපත් පෞරුෂයක් සඳහා අවශ්‍ය චින්තන හැකියාවන් (Thinking skills) සමාජ හැකියා (Social skills ) ස්වයං හැකියා (Personal skills) ආදිය වර්ධනය කිරීමේ අරමුණින් පාසල් කාලය තුළ ලබාදීමට බලාපොරොත්තු වන නව විෂය නිර්දේශයක් ලෙස මෙය හඳුන්වා දිය හැක.

ගැටලුවකට මුහුණදීමේ දී පෙර සූදානමක් ඇති කටයුතු කිරීමට හුරු කිරීම ඉතා ම අවශ්‍ය යි. එබැවින් හෙට දින ලෝකය ජය ගැනීමේ ඉලක්කය ඇතිව මෙම නව විෂය නිර්දේශය සකස් කර ඇත. මනා පෞරුෂයකින් හෙබි යහපත් පුරවැසියන් බිහි කිරීම මෙම විෂය නිර්දේශයේ අරමුණ යි.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර, ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිසන් සභා වාර්තාව - 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයක් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) ''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## විෂය අරමුණු

- භරත නැටුම් සම්බන්ධ විෂය සමගාමී ක්‍රියාකාරකම් මඟින් දැනුම ආකල්ප හා කුසලතා ඇති කර ගනියි.
- නර්තන කලාකරුවකු වීමට අවශ්‍ය පෞරුෂයක් ගොඩනගා ගනියි.
- නිර්මාණාත්මක හැකියා දියුණු කර ගනියි.
- විවිධ වූ දේශීය කලා අධ්‍යයනය කර ඇගයීමට ලක් කරයි.
- සෞන්දර්යාත්මක ව රස වින්දනය කරයි.
- කලාකරුවන් ඇගයීමේ ආකල්ප දියුණු කර ගනියි.
- සම්ප්‍රදාය හා සංස්කෘතිය රැක ගැනීමේ ආකල්ප දියුණු කර ගනියි.
- තම හැකියාවන් අවබෝධ කරගෙන ප්‍රාසංගික කලා ඉදිරිපත් කිරීමේ කුසලතාව ලබයි.
- ජන සන්නිවේදන කුසලතාව ලබයි.
- ස්වයං ලෙස ඉදිරිපත් වී කැපවීමෙන් කටයුතු කිරීමේ කුසලතාවය ලබයි.
- ස්වාභාවික පරිසරය රස වින්දනය කර ප්‍රකාශ කිරීමේ කුසලතාවය ලබයි.
- නව තාක්ෂණික උපකරණ භාවිත කිරීමේ කුසලතාවය ලබයි.
- එදිනෙදා ජීවිතය සඳහා අවශ්‍ය මූලික අභ්‍යාස කරයි.
- ශිල්ප ක්‍රම අනුගමනය කරමින් නව නිර්මාණ ඉදිරිපත් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමේ කුසලතාව ලබයි.
- විවිධ සංස්කෘතිවලට අයත් සමාජයක් තුළ මානව සම්බන්ධතා මනා ලෙස ගොඩ නගයි.
- සාමාජීය පිළිගැනීමට හා ප්‍රශංසාවට ලක්වෙයි.
- කලාවේ ඇති සියුම් දේවල් අධ්‍යයනය කර විස්තර කිරීමේ හා විමර්ශනය කිරීමේ කුසලතාව ලබයි.
- කලාව පිළිබඳ සොයා ගැනීම් කර ඒවා නවතාවකින් ඉදිරිපත් කරයි.

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
|---|---|
| I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම | • සම්ප්‍රදායන් හා සංස්කෘතිය රැක ගැනීමේ ආකල්ප දියුණු කර ගනියි.<br>• විවිධ සංස්කෘතියන්ට අයත් සමාජයක් තුළ මානව සම්බන්ධතා මනා ලෙස ගොඩ නගයි. |
| II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම | • ශිල්ප ක්‍රම අනුගමනය කරමින් නව නිර්මාණ ඉදිරිපත් කරයි. |
| III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම | |
| IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම | • කලාකරුවන් ඇගයීමේ ආකල්ප දියුණු කර ගනියි.<br>• තම හැකියාවන් අවබෝධ කරගෙන ප්‍රාසාංගික කලාවන් ඉදිරිපත් කිරීමේ කුසලතාවය ලබයි. |
| V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම | • භරත නැටුම් සම්බන්ධ විෂය සමගාමී ක්‍රියාකාරකම් මඟින් දැනුම ආකල්ප හා කුසලතා ඇති කර ගනියි.<br>• නිර්මාණාත්මක හැකියාවන් දියුණු කර ගනියි.<br>• සෞන්දර්යාත්මකව රස වින්දනය කරයි.<br>• කලාව පිළිබඳ සොයා ගැනීම් කර ඒවා නවතාවකින් ඉදිරිපත් කරයි. |

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
|---|---|
| VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම | • ජන සන්නිවේදන කුසලතාව ලබයි.<br>• නව තාක්ෂණික උපකරණ භාවිතා කිරීමේ කුසලතාව ලබයි.<br>• කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමේ කුසලතාව ලබයි. |
| VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම | • එදිනෙදා ජීවිතය සඳහා අවශ්‍ය මූලික අභ්‍යාස කරයි. |
| VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003) | • නර්තන කලාකරුවෙක් වීමට අවශ්‍ය පෞරුෂයක් ගොඩනගා ගනියි.<br>• විවිධ වූ දේශීය කලා අධ්‍යයනය කර ඇගයීමට ලක් කරයි.<br>• ස්වයං ලෙස ඉදිරිපත් වී කැපවීමෙන් කටයුතු කිරීමේ කුසලතාව ලබයි. |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසරය විචාරශීලී ව රස වින්දනය කරයි. | 1.1 ස්වාභාවික පරිසරය විචාරශීලී ව රස විඳ විස්තර කරයි. | ♦ සත්ත්ව චලන<br>• වඳුරා<br>• මුවා<br>• හාවා<br>• නරියා<br>• ඔටුවා<br>• සර්පයා | • ස්වාභාවික පරිසරයේ දකින සත්ත්ව චලන රස විඳිමින් විචාර කරයි. | 02 |
| | 1.2 ගැමි නැටුම් රස විඳිමින් විචාරාත්මකව අගය කරයි. | ♦ ගැමි නැටුම්<br>• කොහොඹ කොළ නර්තනය | • ගැමි නැටුම් හා භරත නැටුම් අතර වෙනස පැහැදිලි කරයි.<br>• ගැමි වාදන භාණ්ඩ හඳුනාගෙන එහි අගය ප්‍රකාශ කරයි.<br>• ගැමි නැටුම් ජීවිත හා බැඳී ඇති ආකාරය විස්තර කරයි. | 01 |
| | 1.3 ගීත කතන්දර රස විඳිමින් එහි අගයයන් ප්‍රකාශ කරයි. | ♦ ගීත කතන්දර<br>• දඩයක්කරුවා සහ පරෙවියා | • දඩයක්කාරයාගේ සහ පරෙවියාගේ කතාව ප්‍රකාශ කරයි.<br>• අදාළ ගීතය ශ්‍රවණය කර සෞන්දර්යාත්මක ලක්ෂණ ප්‍රකාශ කරයි. | 01 |
| 2.0 පරිසරය පිළිබඳ තමා රස විඳි විවිධ වූ ගීත හා කෝර්වෙව අභිරූපණය කරයි. | 2.1 ස්වාභාවික පරිසරියේ තමා රස විඳ භාවාත්මක ව ප්‍රකාශ කරයි. | ♦ සත්ත්ව චලන<br>• වඳුරා<br>• මුවා<br>• හාවා<br>• නරියා<br>• ඔටුවා<br>• සර්පයා /නයා | • ස්වාභාවික චලනවලට කල්පිත ස්වරූපයක් ලබාදෙයි. ඉදිරිපත් කරන ආකාරය ප්‍රකාශ කරයි.<br>• තමාගේ නිර්මාණවලට ගැළපෙන පරිදි එම චලන ඉදිරිපත් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ගීත කතන්දර භාවාත්මක ව ඉදිරිපත් කරයි. | ♦ කතා ගීත<br>• දඩයක්කාරයා සහ පරෙවියා<br>• කන්නන් මාඩු කන්රුමේයිත්තු (හරකා හා පැටියා බලාගන්නා ගොපල්ලා) | • ගීතවල අදහස ප්‍රකාශ කරයි.<br>• අදහස්වලට සුදුසු මුද්‍රා යොදා ගනියි.<br>• අභිනය ගීත සඳහා නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 06 |
| | 2.3 ගැමි ගී සඳහා නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | ♦ කොහොඹ කොළ නැටුම | • අම්මන් දෙවියන් සඳහා කොහොඹ කොළ නැටුම ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරයි.<br>• ගැමි සම්ප්‍රදායයට අනුව නර්තන අංග ඉදිරිපත් කරයි. | 02 |
| 3.0 භරත නර්තන සම්ප්‍රදායයට අදාල මූලික අභ්‍යාස අඩවු විවිධ පේශී ක්‍රියාකාරකම් ජාති හස්තාංග නර්තන උරුප්පඩි ආදිය අභිනයෙන් ඉදිරිපත් කරයි. | 3.1 මුද්‍රා විනියෝග නිරූපණය කරයි. | ♦ විනියෝග<br>• මුෂ්ටි - සිංහ මුඛ | • විනියෝග අදහස ප්‍රකාශ වන පරිදි නර්තන අංග ඉදිරිපත් කරයි.<br>• නිරූපණය කිරීම් පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | 10 |
| | 3.2 හස්ත, භේද ඉදිරිපත් කරයි. | ♦ භේදම්<br>- ශිරෝ භේදම්<br>- දෘෂ්ටි භේදම්<br>- ග්‍රීවා භේදම්<br>- පාද භේදම් | • ශිරෝ, දෘෂ්ටි, ග්‍රීවා පාදභේද නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි. | 05 |
| | 3.3 භරත නැටුම් හා මූලික අඩවු නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි. | තෙයියා තෙයියි (1-4)<br>තත් තෙයි තාහා (1-4)<br>තත් තෙයි තාම් (1-3) | • තෙයියා තෙයියි, තත් තෙයි තාම් තත් තෙයි තාහා අඩවු නිවැරදි ව මුද්‍රා සහිත ව අභිරූපණය කරයි.<br>• එය තාලයට අනුරූප ව ඉදිරිපත් කරයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 විවිධ වූ ගැමි නැටුම් ඉදිරිපත් කරයි. | ♦ ලී කෙළි | • ගැමි නැටුමේ දී භාවිත පා චලන ඉදිරිපත් කරයි.<br>• වෙනස් ආකාරයේ නිර්මාණ අංග ඉදිරිපත් කරයි. | 03 |
| 4.0 නර්තනයේ මූලික අංග සහ සංකල්ප විස්තර කරයි. | 4.1 විවිධ වූ අභිනය වර්ග විස්තර කරයි. | ♦ අභිනයම්<br>අංගිකම් (ආංගික)<br>වාචිකම් (වාචික)<br>සාත්විකම් (සාත්ත්වික)<br>ආහාර්යම් (ආහාර්ය) | • සතර අභිනය විස්තර කරයි.<br>• ආංගික, වාචික, සාත්ත්වික, ආහාර්ය අභිනය විස්තර කරයි. | 01 |
| | 4.2 අඩවුවලට අදාළ ප්‍රස්තාර සංකේත භාවිත කරයි. | ♦ ස්වර ප්‍රස්තාර විස්තර<br>• තට්ටඩවු<br>• නාට්ටඩවු<br>• කුදින්තු මෙට්ටඩවු<br>- තා තෙයි තෙයි .<br>- තෙයියා තෙයියි<br>- තයියත් තෙයි<br>- තත් තෙයි තාම් (1-3)<br>- තත්තෙයි තාහා (1-4) | • ස්වර ප්‍රස්තාර උපයෝගි කර ගනිමින් අඩවු ලියා දක්වයි. | 10 |
| | 4.3 භරත නාට්‍යයේ පොදු සංකල්ප විස්තර කරයි. | ♦ • ශිරෝ භේදම්<br>• දෘෂ්ටි භේදම්<br>• ග්‍රීවා භේදම්<br>• පාද භේදම් - 4<br>• පාත්‍ර, අපාත්‍ර ලක්ෂණ<br>• අරංග දෙවදාස් තුදී | • භරත නර්තනයට අදාළ විවිධ කොටස් විස්තර කරයි.<br>• පාත්‍ර, අපාත්‍ර ලක්ෂණ ප්‍රකාශ කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.4 සංගීත භාණ්ඩ නම් කරයි. | ♦ • සම් භාණ්ඩ<br>• ශුෂිර භාණ්ඩ<br>• ඝන වාද්‍ය භාණ්ඩ<br>(ශුභ අවස්ථා නාදස්වරම්) | • සංගීත භාණ්ඩ වර්ග නම් කරයි.<br>• අදාළ වර්ගවලට අයත් සංගීත භාණ්ඩ නම් කරයි.<br>• නාදස්වර හඳුනා ගනියි.<br>• නාද ස්වරම් හි සම්භවය හා භාවිතවන ආකාරය විස්තර කරයි.<br>• එම නම යෙදීමට හේතු සඳහන් කරයි.<br>• නාද ස්වර ශිල්පීන්ගේ නම් සඳහන් කරයි. | |
| 5.0 නර්තනයේ සංස්කෘතික පසුබිම හා ඓතිහාසික පසුබිම හඳුනාගනියි. | 5.1 ඉන්දියානු නැටුම්වල සංස්කෘතික පසුබිම විශ්ලේෂණය කරයි. | ♦ ශ්‍රී ලංකාවේ භරත නාට්‍ය<br>• සංගකාලම්<br>• සංගමරුවිය කාලම් | • භරත නාට්‍ය සම්භවය වූ කාලවකවානු ප්‍රකාශ කරයි.<br>• නැටුමට ඇතුළත් අංග විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති නැටුම් පිළිබඳ ව විමර්ශනය කරයි.<br>• ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින නැටුම් පිළිබඳ විමසා බලයි | 04 |
| | 5.2 ගැමි නැටුම් හඳුනා ගනියි. | ♦ මෙහෙ නැටුම් | • මෙහෙ නැටුම් යන්නෙහි අරුත අවබෝධ කරයි<br>• මෙහෙ නැටුම් ආකාර ප්‍රකාශ කරයි. | 02 |